*සැ. යු.*- 2021.12.31 දින පළ වූ අංක 2261 *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,262 - 2022 ජනවාරි මස 07 වැනි සිකුරාදා - 2022.01.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 2 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 4 |
| විවිධ දැන්වීම් ... ... ... ... | 5 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 ජනවාරි මස 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජනවාරි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1- B 082305 — 353 (2022/01)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දිසා අධිකරණයේ දී ය

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හැඳින්වූ)
අංක 236, ගාලු පාර, කොළඹ 03.

නඩු අංකය : DHP 1709/17
ඇස්කිසි අංකය : 10/2020

*..................පැමිණිලිකරු.*

*එදිරිව*

01. රණසිංහ ආරච්චිගේ දෝන නදීෂා ප්‍රියංගි රණසිංහ, අංක 268/3, පැලැන්වත්ත, පන්නිපිටිය.

02. රණසිංහ ආරච්චිගේ දොන් චන්ද්‍රදාස අංක 268/3, පැලැන්වත්ත, පන්නිපිටිය.

03. රණසිංහ ආරච්චිගේ දොන් සුමුදු මහේන්ද්‍ර, අංක 343/ඒ, 2, ඇරැව්වල, පන්නිපිටිය.

*දැනට*

අංක 343/1, මහවත්ත පාර, ඇරැව්වල, පන්නිපිටිය.

04. කසුන්ක ගයාන් එදිරිසිංහ, අංක 271, පැලැන්වත්ත, පන්නිපිටිය.

*.................විත්තිකරුවන්.*

ඉහත නම් සඳහන් 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන් වෙතය.

මෙම නඩුවෙහි වර්ෂ 2017 ක් වූ අගෝස්තු මස 10 වැනි දින ඇතුළත් කර ඇති තීන්දු, ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි මෙම නඩුවෙහි 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන්ට විරුද්ධව,

රු. 200,976.38 ක ප්‍රමාණ වූ හිඟ වාරික මුදල් එකතුව ගෙවීමටත්,

ඉහත කී හිඟ වාරික මුදල් මත පැමිණිල්ලේ දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා පවතින පොළී අනුපාතය වන මසකට 4% ක පොළී අනුපාතිකයට අදාලව ගණනය කළ පොළී මුදලක් ද, ඉන්පසු තීන්දු ප්‍රකාශයේ දින සිට එකී මුදල් ගෙවා නිම කරන දින දක්වා නෛතික පොළිය ගෙවීමටත්,

එකී ගිවිසුම යටතේ කුලියට දීම අවසන් කිරීමෙන් පසු 2015 ක් වූ ජුනි මස 29 වැනි දින සිට සිදු වී ඇති අලාභ වශයෙන් රු. 4,359,092.71 ක මුදලක් අලාභ වශයෙන් ද, එම මුදල සඳහා පැමිණිල්ලේ දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා පවතින පොළී අනුපාතය වන මසකට 4% ක පොළී අනුපාතයට අදාලව ගණනය කළ පොළී මුදලක් ද, ඉන්පසු තීන්දු ප්‍රකාශයේ දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දින දක්වා නෛතික පොළියද ගෙවීමටත්,

වෙනත් වියදම් සඳහා රු. 27,763.10 ක මුදලක් ද, රක්ෂණ ගාස්තු වශයෙන් රු. 72,068.38 ක මුදලක් ද, එකී මුදල් මත පැමිණිල්ලේ දින සිට තීන්දු ප්‍රකාශිත දින දක්වා පවතින පොළී අනුපාතය වන මසකට 4%ක පොළී අනුපාතිකයට අදලව ගණනය කළ පොළී මුදලක් ද, ඉන්පසු තීන්දු ප්‍රකාශයේ දින සිට එකී මුදල් සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දින දක්වා නෛතික පොළිය ද ගෙවීමටත්,

නඩු ගාස්තු ද, ගරු අධිකරණයට සුදුසු යයි හැඟෙන වෙනත් වැඩිමනත් සහනයන් ලබා ගැනීමටත් වේ.

සියලුම අයකිරීම් තීන්දු ප්‍රකාශයේ දින සිට මාස 02 ක් තුළදී හෝ එකී තීන්දු ප්‍රකාශයේ අධිකරණය විසින් නියම කරන ඊට වඩා දීර්ඝ කාලයකදී ගෙවීම පැහැර හරින්නේ නම් මෙහි පහත උපලේඛනයේ විස්තර වන හා වර්ෂ 2013.01.07 සහ 2013.04.11 වැනි දින ලියා සහතික කරන ලද අංක 694 සහ 771 දරන උකස් බැඳුම්කර යටතේ ඇප වශයෙන් තබා ඇති එකී ඉඩම හා ඊට අදාල දේපළ අධිකරණය විසින් පත් කරන බලයලත් වෙන්දේසිකරුවෙකු ලවා අධිකරණය විසින් අනුමත කරන ලද විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙස ආඥා කරනු ලැබ ඇති බැවින් ද,

එලෙස තීන්දු කරන ලද තීන්දුව අනුව විත්තිකරුවන් විසින් ගෙවීම පැහැර හැර ඇති බැවින් එකී මුදල් අයකර දීම සඳහා කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් නිසි ලෙස තහනමට ගෙන ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර මෙහි පහත උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වෙන නිශ්චල දේපල, ඉඩම හා ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ ආදී සියලු දේ.

**වර්ෂ 2022 ක් වූ පෙබරවාරි මස 22 වැනි දින පෙ. ව. 11.00ට** එකී දේපල පිහිටා ඇති බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පැලැන්වත්ත නමැති ගමේ අංක 268/3 දරන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

i. මුල් ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
ii. තක්සේරු ගාස්තුව වන 0.5% ක් ද,
iii. වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු ද,

විකිණීම අවසන් වූ වහාම ගැණුම්කරු විසින් අදාල මුදල, මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම් ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30 ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ කැස්බෑව නගර සභා බල ප්‍රදේශය තුළ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැලන්වත්ත උතුර (582) ග්‍රාම නිලධාරී වසමෙහි පැලන්වත්ත යන ගම පිහිටි ඇගුලකනත්ත *නොහොත්* එගොඩවත්ත *නොහොත්* එගොඩකනත්ත නමැති ඉඩමට එස්. ජී. ඇල්විටිගල අවසරලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 4662 සහ වර්ෂ 2015 ක් වූ මාර්තු මස 15 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ එහි ලොට් වයි දරන බිම් කොටස වන උතුරට : පිඹුරු අංක 4198 හි ලොට් 1සී ද, නැගෙනහිරට : පිඹුරු අංක 4198 හි ලොට් 1සී, 2බී, සහ 2ඒ ද, දකුණට : මෙම පිඹුරේ ලොට් එක්ස් ද සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් එක්ස් ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් අට (අක්. 0, රූඩ්. 0, පර්. 8) ක් විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේද යන මෙකී දේපල වේ. මෙම ඉඩම දෙල්කද - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C484/14 හි ලියාපදිංචි කර ඇත.

*මාර්ග අයිතිය.-*

ඉහත කී පැලන්වත්ත යන ගම පිහිටි ඇගුලකනත්ත *නොහොත්* එගොඩවත්ත *නොහොත්* එගොඩකනත්ත නමැති ඉඩමට එන්. ජී. ඇල්විටිගල අවසරලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 4198 සහ වර්ෂ 2013 ක් වූ ජුනි මස 30 වැනි දින දරන පිඹුර ප්‍රකාර අඩි 10 ක් පළල පාරක් සඳහා බෙදා වෙන් කළ එහි ලොට් 1 සී දරන බිම් තීරය වන උතුරට - පෞද්ගලික පාර ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් 2 බී ද, දකුණට : මෙම පිඹුරේ ලොට් 1බී ද සහ බස්නාහිරට - පාරක් සඳහා වෙන් කළ බිම් තීරය ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් අටයි දශම හයයි හය (අක්. 0, රූඩ්. 0, පර්. 8.66) ක් විශාල බිම් තීරයේ පොදු මාර්ග අයිතිය ද සමග වේ. මෙම ඉඩම දෙල්කද- නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C484/15 හි ලියාපදිංචි කර ඇත.

*දේපලට පිවිසීම.-* සිකුරාදා පොළ හන්දියෙන් හැරී කි. මී. 1. 1/2 ක් කොට්ටාව දෙසට ගමන් ගන්නා විට වම්පස ''දූ දරුවෝ'' වලව්ව හමුවේ. ඒ ඉදිරිපිට පිහිටි ඉඩම වේ.

රෙජිස්ට්‍රාර් - නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කැස්බෑව.

වර්ෂ 2021 ක් වූ දෙසැම්බර් මස 16 වැනි දින දී ය.

01-03

# නොතාරිස් ලැයිස්තුව

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි

රාජ පොකුණ වත්ත, දඹදෙණිය දරන ස්ථානයේ පදිංචි හීරළු පතිරන්නැහැලාගේ හරිත සුදත් වීරසිංහ වන මම, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස, නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරය) 07 වැනි වගන්තිය ප්‍රකාරව මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

එච්. පී. හරිත සුදත් වීරසිංහ.

2021 දෙසැම්බර් මස 28 වැනි දින,
රාජ පොකුණ වත්ත,
දඹදෙණිය.

01-37

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි

නෙටොල්පිටිය, ගොඩිගමුව, අංක 129/ඒ දරන ස්ථානයේ පදිංචි ජයසූරිය පටබැඳිගේ බුද්ධි අසන්තිකා වන මම, හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස, 107 වැනි අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 07 වැනි වගන්තිය ප්‍රකාරව මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

ජේ. පී. බී. අසන්තිකා.

2021 දෙසැම්බර් මස 31 වැනි දින,
129/ඒ,
ගොඩිගමුව,
නෙටොල්පිටිය.

01-44

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි

සමන්තුරෙයි, අම්පාර, 11 වැනි පටුමග, අංක 304 දරන ස්ථානයේ පදිංචි, මුහයිදීන් බාවා රිෆායා වන මම, අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ මහාධිකරණ කලාපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස, නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

එම්. බී. රිෆායා.

2021 දෙසැම්බර් මස 30 වැනි දින,
අංක 304,
11 වැනි පටුමග,
සමන්තුරෙයි, අම්පාර.

01-45

# විවිධ දැන්වීම්

**(සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය.**

නඩු අංකය : CHC/75/2021/CO.
ස්වභාවය : ඈවර කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ කොළඹ 03, ශා. මයිකල් පාර, අංක 18 හි සහ කොළඹ 15, රොක් හවුස් පටුමග, අංක 15 හි පිහිටි, සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PV100361 දරන වෝකර්ස් කලම්බො ෂිප්යාඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් නම් සමාගම ගරු අධිකරණය විසින් ඈවරකරනු ලැබීම සඳහා වූ ඉල්ලීම සම්බන්ධයෙන් වන කාරණයේ දී ය.

කොළඹ 01, ශ්‍රීමත් රාසීක් ෆරීඩ් මාවත. අංක 21 යන ලිපිනයේ ''විදේශීය ශාඛාව'' නමින් හැඳින්වෙන හා දන්නා ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් පිහිටි, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී, අංක 21, ශ්‍රීමත් රාසීක් ෆරීඩ් මාවත, කොළඹ 01.

..............................*පෙත්සම්කරු.*

බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක්, වර්ෂ 2021 ක් වූ ඔක්තෝබර් මස 04 වැනි දින එකී අධිකරණය වන පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ කේ. උපේන්ද්‍ර ගුණසේකර විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම වර්ෂ 2022 ක් වූ පෙබරවාරි මස 23 වැනි දින අධිකරණය ඉදිරියෙහි විමසීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත්කාර්ය සඳහා එය විමසීමට ලක් කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍යවන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. උපේන්ද්‍ර ගුණසේකර,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක. 135-1/3, ගුණසිංහපුර කාර්යාල සංකීර්ණය,
ශාන්ත සෙබස්තියන් වීදිය,
කොළඹ 12.

*සටහන :*

එකී පෙත්සම විමසීමට ලක් කරන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ කේ. උපේන්ද්‍ර ගුණසේකර වෙත භාර දිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2022 ක් වූ පෙබරවාරි මස 22 වැනි දින සවස 06 ට පෙර ලැබෙන ලෙස භාර දිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතුය.

12-20

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

## 2022 වර්ෂය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **ජනවාරි** | 2022.01.07 | සිකුරාදා | 2021.12.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.13 | බ්‍රහස්පතින්දා | 2021.12.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.21 | සිකුරාදා | 2022.01.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.28 | සිකුරාදා | 2022.01.13 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2022.02.03 | බ්‍රහස්පතින්දා | 2022.01.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.11 | සිකුරාදා | 2022.01.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.18 | සිකුරාදා | 2022.02.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2022.02.25 | සිකුරාදා | 2022.02.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2022.03.04 | සිකුරාදා | 2022.02.18 | සිකුරාදා | දහවල් | 01.00 |
| | 2022.03.11 | සිකුරාදා | 2022.02.25 | සිකුරාදා | දහවල් | 01.00 |
| | 2022.03.18 | සිකුරාදා | 2022.03.04 | සිකුරාදා | දහවල් | 01.00 |
| | 2022.03.25 | සිකුරාදා | 2022.03.11 | සිකුරාදා | දහවල් | 01.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.